ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන පස්වන මට්ටම 2022/2023

අවසාන පරීක්ෂණය 2023

**STU5314 - අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය**

කාලය -පැය තුනයි. (03)

---

දිනය - 2023.11.22 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. වර්තමානයේ ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියෙන් බැහැරව ක්‍රියාත්මක වන මාර්ගෝපදේශ හා උපදේශන මධ්‍යස්ථානයක් නම් කර ඔවුන් විසින් විශේෂඥතාවයක් දක්වන උපදේශන ක්ෂේත්‍ර වේ නම් ඒවා අවධාරණය කරමින් එම මධ්‍යස්ථානය විසින් සපයනු ලබන සේවය විස්තර කරන්න.

02. තමන්ට රුචි වූ වෘත්තීන් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ ද්විතියික පාසල් ශිෂ්‍යයනට උපකාර වන, ඔවුන් තුළ සංවර්ධනය කළ යුතු කුසලතා දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

03. පාසල් ළමුන් තුළ කලහකාරී බව ඇති වීමට මුල් වන හේතු දෙකක් (02) කෙටියෙන් විභාග කරන්න.

04. දෘශ්‍ය ඌනතා සහිත ශිෂ්‍යයින් තුළ නිරීක්ෂණය කළ හැකි චර්යා තුනක් (03) අවධාරණය කරමින් ගුරුවරයා විසින් තම පංතිකාමරය තුළ සිටින එබඳු ශිෂ්‍යයින් හඳුනා ගත හැක්කේ කෙසේද යන්න සාකච්ඡා කරන්න.

05. සුදුසු උදාහරණ දෙකක් (02) දෙමින් පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාව විසින් නව යෞවනයින් තුළ සමබර පෞරුෂයක් සංවර්ධනය කිරීම සඳහා සහාය දැක්විය හැක්කේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

06. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ඉගෙනුම් නොහැකියා සහිත ළමුන්ගේ සහභාගිත්වය සුසාධ්‍ය කිරීම සඳහා ගුරුවරයා විසින් භාවිත කළ හැකි උපායමාර්ග පහක් (05) සඳහන් කරන්න.

07. වෘත්තීය මාර්ගෝපදේශය සැපයීම සඳහා උපකරණයක් ලෙස 20 වන ශත වර්ෂයේ මුල් භාගයේ දී ෆ්‍රෑන්ක් පාසන්ස් (Frank Parsons) විසින් හඳුන්වා දෙන ලද පාසෝනියන් ආකෘතිය විශ්ලේෂණය කරන්න.

08. ඈන් රෝ (Anne Roe) ගේ වෘත්තීය උපදේශන න්‍යායට අනුව ජ්‍යෙෂ්ඨ ද්විතියික පාසල් ශිෂ්‍යයින්ට වෘත්තීය මාර්ගෝපදේශය සැපයීමේ දී පාසල් මාර්ගෝපදේශ හා උපදේශන ඒකකය විසින් යොදා ගත හැකි උපායමාර්ග දෙකක් (02) පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) ළමුන්ගේ පෞරුෂ සමායෝජනයට බාධාකාරී විය හැකි සාධක හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) " පාසල් ළමුන් තුළ සමායෝජී වීමට අපොහොසත් වීම අධ්‍යාපනික ගැටළු ඇති කළ හැක."
සුදුසු උදාහරණ දෙකක් (02) දෙමින් ඉහත සඳහන් ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 06)

(iii) ඔබ, ඔබගේ පාසලේ උපදේශන ඒකකය භාර ගුරුවරයා බවත් සමායෝජී වීමේ ගැටළු සහිත ශිෂ්‍යයකු ඔබගේ සහාය පතන බවත් සිතන්න. මෙම ශිෂ්‍යයාට උපදේශනය ලබා දීම සඳහා භාවිතා කළ හැකි ශිල්ප ක්‍රමයක් ලෙස ආත්මචරිත කථාවල ප්‍රයෝජනවත් බව අගයන්න. (ලකුණු 10)

10. (i) පවුල් සන්දර්භයෙහි වෙනස්කම් ශ්‍රී ලාංකීය පාසල් පද්ධතිය තුළ මාර්ගෝපදේශ හා උපදේශන සේවා සඳහා අවශ්‍යතාවයක් නිර්මාණය කර ඇත්තේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ප්‍රාථමික පාසල් ළමුන් අත්දකින සුවිශේෂී දුෂ්කරතා හෝ අක්‍රමතා පාසල් උපදේශන සේවයෙහි සහාය පැතීම සඳහා අවශ්‍යතාවයක් නිර්මාණය කර ඇති ආකාරය උදාහරණ දෙකක් (02) ඇසුරෙන් විශ්ලේෂණය කරන්න (ලකුණු 06)

(iii) අ) විරුද්ධ ලිංගිකයින් සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීමේ දී සහ පවත්වා ගැනීමේ දී නව යෞවනයින්ට මුහුණ දීමට සිදු විය හැකි ගැටළු දෙකක් (02) සඳහන් කරන්න. (ලකුණු 01 x 02 = 02)

ආ) ඔබ ඉහත (අ) යටතේ සඳහන් කළ එක් (01) ගැටළුවක් වැළැක්වීම හෝ ජය ගැනීම සඳහා පාසල් උපදේශන සේවාව විසින් නව යෞවනයින් හට උපකාර කළ හැක්කේ කෙසේද යන්න එම උපදේශන සේවාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි සුවිශේෂී ක්‍රියාකාරකම් දෙකක් (02) ඇසුරෙන් විභාග කරන්න. (ලකුණු 08)

11. (i) පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාවක් පිහිටුවීමේ දී සහ පවත්වා ගැනීමේ දී යොදා ගත හැකි මඟපෙන්වීම් දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02 x 02 = 04)

(ii) "ශිෂ්‍යයාගේ සංවර්ධනයට සහාය වන, පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාව විසින් යොදා ගනු ලබන මූලික ක්‍රියාකාරකම්වලින් එකකි, ස්ථානගත කිරීම."
පාසල තුළ ස්ථානගත කිරීම සහ පාසලෙන් පිටත ස්ථානගත කිරීම යන ද්විත්වයම වෙත සුවිශේෂී ලෙස අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 06)

(iii) ඔබ, ඔබගේ පාසලෙහි මාර්ගෝපදේශ හා උපදේශන සේවාවක් ස්ථාපිත කිරීමට සැලසුම් කරමින් සිටින බව සිතන්න. අදාළ පාසල් සන්දර්භය වෙත සුවිශේෂී ලෙස අවධානය යොමු කරමින් එම සේවාවෙහි සංවිධානාත්මක ආකෘතිය ලෙස සමෝධානිත ආකෘතිය භාවිතා කිරීමෙහි සුදුසු බව අගයන්න. (ලකුණු 10)

12. (i) පාසල් ළමුන්ට උපදේශනය සැපයීමේ දී උපදේශන ශිල්පක්‍රම භාවිතා කිරීමෙහි ප්‍රතිලාභ හතරක් (04) සඳහන් කරන්න. ( ලකුණු 01 x 04 = 04)

(ii) ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක් සිදු කිරීමේ දී භාවිතා කළ හැකි උපදේශන ශිල්පක්‍රම අවම වශයෙන් දෙකක් (02) වත් විස්තර කරමින් ප්‍රත්‍යක්ෂ අධ්‍යයන නම් ශිල්ප ක්‍රමය, අධික්‍රියාශීලී හැසිරීම් පෙන්වන ශිෂ්‍යයකු පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීම සඳහා යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) අධික්‍රියාශීලී හැසිරීම් සහිත ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක පිළිබඳ ව ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක් සිදු කිරීමෙන් පසුව උපදේශකවරයා විසින් ඔහුගේ/ඇයගේ සමස්ත සංවර්ධනය සුසාධ්‍ය කළ හැක්කේ කෙසේද යන්න සඳහා යොදාගත හැකි උපායමාර්ග තුනක් (03) ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

13.(i) උපදේශනයේ මනෝවිශ්ලේෂණවාදී ප්‍රවේශයෙහි මූලික දර්ශනය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ෆ්‍රොයිඩියානු මනෝවිශ්ලේෂණවාදී ප්‍රතිකාරයෙහි එන ප්‍රධාන අරමුණු දෙක (02) එම එක් එක් අරමුණ ඉටුකර ගැනීම සඳහා භාවිතා කළ හැකි ශිල්ප ක්‍රම අවම වශයෙන් එකක් (01) වත් ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. ( ලකුණු 03 x 02 = 06)

(iii) "මනෝවිශ්ලේෂණවාදය, උපදේශනයේ ප්‍රතිකාරාත්මක ප්‍රවේශ අතරින් පැරණිම එකක් ලෙස සලකනු ලැබේ."

නූතන ලෝකයෙහි ශිෂ්‍යයින් විසින් අත්විඳිනු ලබන මානසික ගැටළු සමග කටයුතු කිරීම සඳහා ඔවුන්ට උපකාර කිරීමේ දී මනෝවිශ්ලේෂණවාදී ප්‍රවේශයෙහි අදාළත්වය අගයන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.